ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
பொருளாதார அபிவிருத்தி அமைச்சு
Ministry of Economic Development

දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
வாழ்வின்எழுச்சி அபிவிருத்தி திணைக்களம்
Department of Divineguma Development

24/4, කාසල් වීදිය, කොළඹ -8.
24/4, காசல் வீதி, கொழும்பு
24/4, Castle street , Colombo - 08.

මගේ අංකය / எனது இல / My No ..........

ඔබේ අංකය / உமது இல / Your No දිවිනැගුම/ජාත්‍යන්තර කොඩි 2014

දිනය / திகதி / Date 2014.05. 21

අතිරේක අධ්‍යක්ෂ ජනරාල්,

කලාප අංක..................

## ජාත්‍යන්තර දුම්වැටි හා මත් විරෝධී දිනය - 2014

සමාජයේ ශක්තිමත්ම බැම්ම අපේ පවුලයි. සමාජය වඩාත් සොදුරු තැනක් කල හැක්කේ පවුල නැමති ඒකකයේ පවත්නා යහපැවැත්ම මතය. මෙම යහපැවැත්ම බිඳ වැටීමට ප්‍රධානතම සාධකය වී ඇත්තේ දුම්වැටි හා මත්ද්‍රව්‍ය භාවිතයයි. මෙබඳු සංවර්ධන ප්‍රතිරෝධකයන්ට පිළියම් සෙවීම අරමුණු කර ගනිමින් ලෝක දුම්වැටි විරෝධි දිනයට සමගාමීව දුම්වැටි නිවාරණ කොඩි වැඩසටහනක් දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කිරිමට සැලසුම් කර ඇත. මේ වර්ෂයේ දී ද දිවිනැගුම කොඩි වැඩසටහන වඩාත් ඵලදායි ලෙස ක්‍රියාවට නැංවීමට සැලසුම් සකස් කර ඇත. සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක්ම ආවරණය වන පරිදි සියලුම ජන කොටස් තුළම මත් හා දුම්වැටි භාවිතයේ ඇති අනර්ථය හා සමාජ විනාශය පිළිබඳ දැනුවත් කළ යුතු අතර මෙම දැනුවත් කිරිම් වඩාත් නිර්මාණශීලිව පුද්ගල මනසට සංවේදී වන අයුරින් සැකසිය යුතු බව කාරුණිකව දන්වමි.

### පරමාර්ථ

01. දිවිනැගුම ජාතික වැඩසටහනට සමගාමීව ප්‍රජාව මත් ද්‍රව්‍යවලින් ඈත් කිරිම ප්‍රධාන අරමුණ වේ. මහින්ද චින්තන ඉදිරි දැක්ම යටතේ අතිගරු ජනාධිපතිතුමාගේ "මතට තිත" සංකල්පය වඩාත් පුළුල් කරමින් රටේ ප්‍රධාන සංවර්ධන ප්‍රතිරෝධකයක් වන මත්ද්‍රව්‍ය භාවිතය අවම කිරිමට වැඩිබරක් දෙමින් ගෘහ ආර්ථිකය ශක්තිමත් කිරිම තවත් අරමුණක් වේ.

02. මෙවර තේමාව **"දැයක් පුබුදමු. මතින් තොර වෙමු.දිවිය නංවමු."** වන අතර එම තේමාවට උචිත පරිදි වැඩසටහන් සම්පාදනය කළ යුතුවේ.

- ❖ මෙම වසරෙහි කොඩි වැඩසටහන පැවැත්වීමට අපේක්ෂිත කාලය මැයි 31 දින සිට ජුනි 15 දින දක්වා වන අතර මත් හා දුම්වැටි භාවිතයෙන් සෞඛ්‍යට වන හානිය හා ආර්ථිකයට වන අහිතකර බලපෑම් පිළිබඳ ජනතාව දැනුවත් කළයුතු අතර පසුගිය වසරේ රුපියල් ලක්ෂ

1245 ක් වූ කොඩි ආදායම මෙම වසරේ දී තවදුරටත් ඉහල නැංවීමට සහ තේමාවට අනුගත වන පරිදි වැඩසටහන් සංවිධානය කල යුතු වේ. මේ වැඩසටහන් පිළිබඳ කලාපීය වාර්තාව මැයි 28 දිනට පෙර ප්‍රධාන කාර්යාලය වෙත දැනුම් දිය යුතුය.

❖ 2014 මැයි 31 දින පෙරවරු 8.00ට කොඩි අලෙවිය ආරම්භ කර 2014.06.15 දින ප.ව. 5.00ට අවසන් කල යුතුවේ. 2014.06.16 දින කලාප කළමණාකරු / මහා සංගම් අධ්‍යක්ෂ ඉදිරියේ කැට විවෘත කළ යුතුය.

## වාර්තා එවීම

❖ කොඩි අරමුදල් එකතු කිරිම සඳහා වසම්භාර නිළධාරින් භාවිතා කරනු ලබන කැට කලාප කළමණාකරු විසින් පරීක්ෂා කොට සිය අත්සන තබා සහතික කළ යුතුවේ. 2014 06. 16 දින කැට විවෘත කිරිමට පෙර කලාප කළමණාකරු විසින් යොදා ඇති අත්සන පරීක්ෂා කර සෑහීමකට පත් විය යුතුය. කැටවල ආරක්ෂාව සම්බන්ධයෙන් වගකීම අදාල කළමණාකරුවන්ට පැවරෙන අතර අමතර පරිත්‍යාග වශයෙන් ලැබෙන ආධාර වෙනම ලේඛණයක සටහන් කල යුතුවේ. එකතු කරන ලද අරමුදල් සම්බන්ධයෙන් දිස්ත්‍රික් වාර්තාව 2014.06.17 දින සිය අතිරේක අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලයට ලබා ගත යුතු වේ. එක් එක් අතිරේක කලාප කාර්යාල විසින් තමාට අයත් සියලුම දිස්ත්‍රික්කවල වාර්තාව 2014.06.18 දින දිවිනැගුම ප්‍රධාන කාර්යාලයේ සමාජ සංවර්ධන අංශය වෙත ලබා දිය යුතුය. වාර්තා කඩිනමින් ලබාදීමට පහත සඳහන් ෆැක්ස් හා විද්‍යුත් තැපැල භාවිතා කල හැකිය.

ෆැක්ස් අංක - 0112678203

විද්‍යුත් තැපැල - champikaslas@gmail.com

❖ මෙවර කොඩි හා ස්ටිකර්හි මුදලක් සඳහන් කර නොමැත. එබැවින් අරමුදල් රැස් කිරිමේ දී ස්වේඡා ජන සහභාගිත්වයෙන් සුවිශේෂි වැඩසටහන් ක්‍රියාත්මක කල යුතු අතර දිවිනැගුම ප්‍රතිලාභීන් වෙතින් බලහත්කාරයෙන් මුදල් එකතු කිරිම කිසිලෙසකත් නොකල යුතු බවට වගබලා ගත යුතුය.

❖ මෙම වර්ෂයේ මුල් කාලය තුල දී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ඉල්ලා ඇති කොඩි හා අනෙකුත් ද්‍රව්‍යයන් මැයි 27 දින අතිරේක කලාප කාර්යාල වෙත ලබාදීමට කටයුතු සුදානම් කර ඇත. ඔබ අතිරේක කලාපයට අයත් අදාල දිස්ත්‍රික් / ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා කොඩි බෙදා හැරීමට සුදුසු වැඩ පිළිවෙලක් සකසා ගත යුතු වේ. ඉල්ලා ඇති කොඩි ප්‍රමාණයන් හි සුළු වශයෙන් අඩු / වැඩිවීමක් සිදු වී ඇත. ( ගණනය කිරිමේ පහසුව නිසාවෙන්) දිස්ත්‍රික්කයට නිකුත් කර ඇති කොඩි හා ස්ටිකර් ප්‍රමාණයන් අනිවාර්යෙන්ම අලෙවි කළ යුතු අතර පිලි ගත හැකි සාධාරණ හේතුවක් මත යම් කොඩි ප්‍රමාණයක් ඉතිරිව තිබේ නම් ඒ පිලිබඳ සැකසූ අතිරේක කලාපීය වාර්තාවද ප්‍රධාන කාර්යාල වෙත එවිය යුතුය.

03. විශේෂ සහන අවශ්‍ය වන සමාජ කොටස්වලට සෘජුවම ප්‍රතිලාභ ලබාදිය හැකි මෙම වැඩසටහන තවදුරටත් සාර්ථකව ක්‍රියාත්මක කිරීම තුලින් දිවිනැඟුම වැඩසටහන සම්බන්ධයෙන් ඇති වී තිබෙන පුළුල් පිළි ගැනීම හා ප්‍රසාදය වර්ධනය කර ගැනීමට හැකි වනු ඇත. පූර්ණ ප්‍රජා දායකත්වයෙන් එකතු කළ යුතු මෙම අරමුදල් සමාජ සංවර්ධන පදනම්හි රඳවා ගන්නා බැවින් ඔබ බල ප්‍ර දේශයේ සියලුම ආගමික නායකයින් , ප්‍රභූවරුන් ,ස්වේඡා නායකයින් ,පාසැල් සිසුන් ,ළමා සමාජ දරුවන් හා දේශපාලන නායකයින් ඇතුළු සියලුම ජන කොටස් වල සහයෝගය ලබා ගෙන වැඩසටහන් උපරිම සාර්ථකත්වයක් කරා මෙහෙයවීමට අවශ්‍ය උපදෙස් ලබා දිය යුතුවේ.

<u>රාජ්‍ය නොවන සංවිධාන දායකත්වය.</u>

අපගේ සමාජ සංවර්ධන වැඩසටහන සමඟ නිරන්තරයෙන් සම්බන්ධ වන රාජ්‍ය නොවන සංවිධානයක් වන Alcohol and Drug Information Centre මගින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වෙත ලබා දෙන පෝස්ටර් ප්‍රතිලාභීන් දැනුවත් කිරීම සඳහා යොදා ගන්නා ලෙසද වැඩිදුරටත් දන්වමි.

04. දිවිනැඟුම සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් සංවිධානය කරනු ලබන ජාත්‍යන්තර දුම්වැටි හා මත් විරෝධී දින වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා කැපවීමෙන් කටයුතු කරන සියලුම නිළධාරීන් ජාතික මට්ටමේ ඇගයීමක් සිදු කිරීමට නියමිත අතර එහි දී හොඳම අතිරේක අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය , දිස්ත්‍රික්කය හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තෝරමින් ඒ ඒ අදියරයන්හිදී නිළධාරීන්ද ඇගයීමට ලක් කරනු ඇත.

07. මෙම කොඩි වැඩසටහන සාර්ථක කිරීමට ඔබ ඇතුළු කාර්ය මණ්ඩලය දක්වන සහයෝගය කෘතවේදීව අගය කරමි.

ආර්.ඒ.ඒ.කේ.රණවක

අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් -

01. ආර්ථික සංවර්ධන අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා - කා.දැ.ස.
02. සියලුම ගරු නියෝජ්‍ය අමාත්‍යතුමන්ලා - කා.දැ.ස.
03. ලේකම් , ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය - කා.දැ.ස.
04. දිස්ත්‍රික් ලේකම්/ දිස්ත්‍රික් අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - කා.දැ.ස.
05. ප්‍රධාන අභ්‍යන්තර විගණක, දිවිනැඟුම සංවර්ධන දෙපාර්තමේන්තුව - දැ.ගැ.ස.